දෘශ්‍ය කලා පීඨය සඳහා සිසුන් බඳවා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය -2025

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනුයේ පරීක්ෂණ මණ්ඩල 04 කින් දෙනු ලබන ලකුණුවල එකතුවක් ලෙස ය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ලකුණු ලැයිස්තු ස්වාධීනව ලබාදෙනු ඇත. විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර විෂය ප්‍රවීණයන්ගෙන්ද මෙම පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව සාකච්ඡා කොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු ලබාදෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 12කි. එක් අපේක්ෂකයකුගේ සමස්ත ලකුණ සකස් වනුයේ ඉහත දක්වන ලද පරීක්ෂකයින් 12 දෙනා ඇතුළත් මණ්ඩල හතරක ලකුණුවල එකතුවෙහි සමස්තය ගණනය කිරීමෙනි. විනිවිදභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ට කිරීම පිණිස මෙම ක්‍රමවේදය පීඨය විසින් අනුගමනය කරනු ලැබේ.

**(1) පළමු පරීක්ෂණය**

(ඇඳීම) මානව දේහය ඇඳීම - පැන්සල් හෝ චාකෝල් මාධ්‍යය භාවිතයෙන් මානව දේහය ඇඳීම.

**ඇගයීමේ නිර්නායක**

i. ලබා දී ඇති සමස්ත කඩදාසියට ගැළපෙන පරිදි සංරචනය කිරීම.
ii. මානව දේහය රේඛා මගින් ගුණාත්මකව ග්‍රහණය කිරීම.
iii. මානව දේහයේ ත්‍රිමාණ ගුණය විදහා දැක්වීම.
iv. මානව දේහයේ අනුපාතයන් හා පරිමාණයන් ගැළපෙන පරිදි ඉදිරිපත් කර තිබීම.
v. සමස්ත නිමාව

*(කාලය පැය 02, ලකුණු 35 යි.)*

**(2) දෙවන පරීක්ෂණය**

(පින්තාරු කිරීම) - දෙන ලද නිශ්චල ද්‍රව්‍ය නිරීක්ෂණයෙන් පින්තාරු කිරීම.

**ඇගයීමේ නිර්නායක**

i. දෙන ලද නිශ්චල ද්‍රව්‍යයන් සමස්ත කඩදාසියට ගැළපෙන පරිදි සංරචනය කිරීම.
ii. වර්ණ භාවිතයෙන් අවකාශ ගුණය පෙර බිම, මැද බිම, පසු බිම ලෙස විදහා දැක්වීම.
iii. දී ඇති නිශ්චල ද්‍රව්‍යයන්ගේ ස්වභාවය හා පෘෂ්ඨීය ලක්ෂණ වර්ණ ආශ්‍රයෙන් විදහා දැක්වීම.
iv. සමස්ත නිමාව.

*(කාලය පැය 02 විනාඩි 30, ලකුණු 35 යි.)*

**(3) තෙවන පරීක්ෂණය**

**කලා රචනය**

පරීක්ෂණයේදී සපයනු ලබන කලා කෘති තුනක් අතුරින් ඔබ විසින් තෝරාගත් එක් නිර්මාණයක් පදනම් කරගෙන එම කෘතියෙහි කලාත්මක හා නිර්මාණාත්මක භාවිතය පිළිබඳ විචාරාත්මක රචනාවක් ගොඩනගන්න. (රචනාව සඳහා අවම වචන 500කි.)

ඇගයීම

දෙන ලද නිර්මාණයට අදාල

i. කලා ලක්ෂණ පිළිබඳ සංවේදීතාව
ii. සංකල්ප පිළිබඳ අවධානය
iii. භාෂා භාවිතයෙන් නිරවුල්ව අදහස් දැක්වීම

*(කාලය පැය 01, ලකුණු 10 යි.)*

## (4) සිව්වන පරීක්ෂණය

### 4.1 නිර්මාණගොනුව

නිර්මාණගොනුව කොටස් දෙකකින් සමන්විතය.

1. අයදුම්කරු විසින් කරන ලද නිර්මාණ
2. ජයග්‍රහණ තහවුරු කිරීමට නියමිත සහතික සහ විශේෂ ප්‍රශංසනාත්මක ලිපි

**නිර්මාණගොනුව සහ ලේඛන ඉදිරිපත් කිරීමට අදාළ විශේෂ උපදෙස්:**

1. ඔබට සපයා ඇති විභාග අංකය නිර්මාණ ගොනුවේ ආරම්භක පිටුවේ සඳහන් කරන්න.

2. නිර්මාණ ගොනුවට ස්වාධීන ප්‍රකාශන, මෝස්තර, ද්‍රව්‍ය සම්පින්ඩණ, මානව දේහ අධ්‍යයනය, භූ දර්ශන, නිර්මාණාත්මක ප්‍රකාශන ආදී ඕනෑම නිර්මාණ එකතුවක් ඇතුළත් කළ හැකිය. එසේම මූර්ති, බිතු කැටයම්, ස්ථාපන ආදී රැගෙන ඒමට අසීරු නිර්මාණවල ඡායාරූප මෙන්ම පරිගණක ආශ්‍රිත නිර්මාණ වේ නම් මුද්‍රිත පිටපත් ඇතුළත් කළ යුතුය. **නිර්මාණ ගොනුවේ, නිර්මාණ 25ත් 30ත් අතර ඇතුළත් විය යුතුය.**

   කැඳවනු ලබන අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් තමන්ගේ විශේෂ කුසලතා ඉදිරිපත් කිරීම උදෙසා දිනා ඇති සහතික හා ප්‍රශංසනාත්මක ලිපි නිර්මාණ ගොනුවට ඇතුළත් කළ යුතුය.

3. සහතිකපත් : ජාතික සහ ජාත්‍යන්තර තරඟවලින් ජයග්‍රහණ ලබාගත් සහතික, විශේෂ ප්‍රශංසනාත්මක ලිපි ආදියෙහි මුල් පිටපත් නිරීක්ෂණය කර ලකුණු ලබාදේ.

**නිර්මාණගොනුවේ ඇතුළත් නිර්මාණ හා සහතික තමාගේ බවට සාමදාන විනිශ්චයකාරවරයෙක්/ග්‍රාමනිළධාරී/විදුහල්පති විසින් සහතික කර තිබිය යුතුය. සහතික නොකරන ලද නිර්මාණගොනු භාරගනු නොලැබේ.**

ලකුණු ලබාදීම සඳහා සළකා බලන ඉසව් පහත දක්වා ඇත.

**ජාතික තලය**

අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය වැනි පිළිගත් ආයතන මගින් පවත්වනු ලබන අවුරුද්දකට නොඅඩු විෂයානුබද්ධ පාඨමාලා (චිත්‍ර, මූර්ති, පෝස්ටර්, ග්‍රැෆික්, මෝස්තර)

**ජාතික සහ ජාත්‍යන්තර ජයග්‍රහණ** (විෂයානුබද්ධ පාඨමාලා - චිත්‍ර, මූර්ති, පෝස්ටර්, ග්‍රැෆික්, මෝස්තර)

මේ සඳහා අදාළ වනුයේ ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය යන ජයග්‍රහණ පමණක්වේ.

සහතික ඇගයීමේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පෙර වර්ෂ 3කට අදාළ සහ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පසු වර්ෂයකට අදාළ සහතික පමණක් සළකා බලනු ලැබේ.

*(උපරිම ලකුණු 20යි)*

දෘශ්‍ය කලා පීඨයේ යෝග්‍යතා පරීක්ෂණය ඇගයීම් ක්‍රියාවලින් පරීක්ෂක මණ්ඩල හතරක් (04) යටතේ සිදුකරනු ලබයි.

අභියෝග්‍යතා පරීක්ෂණයේ පරීක්ෂණ මණ්ඩල සංයුතිය

එක් එක් පරීක්ෂණ මණ්ඩල සඳහා වෙන වෙනම කණ්ඩායම් ඇතුළත් වේ.

**පළමු පරීක්ෂණ මණ්ඩලය (ප්‍රායෝගික) - ඇඳීම**

i අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලයේ විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් - 02
ii බාහිර විෂය ප්‍රවීණයන් - 01

**(සම්පූර්ණ ගණන 03)**

**දෙවන පරීක්ෂණ මණ්ඩලය (ප්‍රායෝගික) - පින්තාරු කිරීම**

i අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලයේ විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් - 02
ii බාහිර විෂය ප්‍රවීණයන් - 01

**(සම්පූර්ණ ගණන 03)**

**තෙවන පරීක්ෂණ මණ්ඩලය (ප්‍රායෝගික) - කලා රචනය**

i අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලයේ විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් - 02
ii බාහිර විෂය ප්‍රවීණයෙක් - 01

**(සම්පූර්ණ ගණන 03)**

**සිව්වන පරීක්ෂණ මණ්ඩලය (නිර්මාණ ගොනුව හා සහතික පරීක්ෂාව)**

i අභ්‍යන්තර ආචාර්ය මණ්ඩලයේ විෂය ප්‍රවීණයන් දෙදෙනෙක් - 02
ii බාහිර විෂය ප්‍රවීණයෙක් - 01

**(සම්පූර්ණ ගණන 03)**

- අභියෝග්‍යතා පරීක්ෂණයට මුහුණදෙන සිසුන් ඉහත පරීක්ෂණ හතරම සඳහාම සහභාගී විය යුතුයි.
- එසේත් අපේක්ෂකයෙක් එක් පරීක්ෂණයක් සඳහා හෝ සහභාගී වී නොමැති වුවද, ඔහුගේ අනෙක් පරීක්ෂණය සඳහා ලකුණු ලබාදේ.

විශේෂ උපදෙස්

සෑම දිනකම යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන වේලාවන් පහත වගුවේ සඳහන් වේ.

| පරීක්ෂණය | වේලාව |
|---|---|
| නිර්මාණගොනුව භාර ගැනීම. (සිව්වන පරීක්ෂණය) | පෙ.ව.8.15 සිට පෙ.ව.8.45 දක්වා පමණක් භාරගනු ලැබේ. |
| පළමු පරීක්ෂණය - ඇඳීම | පෙ.ව.9.00 සිට පෙ.ව.11.00 දක්වා |
| තෙවන පරීක්ෂණය - කලා රචනය | පෙ.ව.11.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| දෙවන පරීක්ෂණය - පින්තාරු කිරීම | ප.ව.1.00 සිට ප.ව.3.30 දක්වා |

***උපදෙස් :*** *චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය කරනු ලබන කඩදාසි සහ ඇඳීමේ ආධාරක (Drawing Boards) පමණක් විශ්වවිද්‍යාලය මගින් සපයනු ලැබේ.*

ඉහත නිර්ණායක සහ ක්‍රමවේදය 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

2025.05.23

පීඨාධිපති
දෘශ්‍ය කලා පීඨය
ආචාර්ය අයි. එම්. ටී. ඉලංගසිංහ
පීඨාධිපති - දෘශ්‍ය කලා පීඨය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය